රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2000

මගේ අංකය :- ආ1/2/4
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2000. සැප්.14

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානින්.

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 33/95 සහ 15/96**
**ක්‍රියාත්මක වීමේ දිනය සංශෝධනය කිරීම.**

1995.11.14 දිනැති අංක 33/95 සහ 1996.06.18 දිනැති අංක 15/96 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛවල සඳහන් විධිවිධාන 1995.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමටත් එදින සිට 1995.10.31 දින දක්වා හිඟ වැටුප් ගෙවීමටත් රජය තීරණය කර ඇත.

03. ඉහත සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීමේදී 33/95 සහ 15/96 රාජ්‍ය පරිපාලන චක්‍රලෙඛ' අදාල වන නිලධාරීන්ගේ වැටුප 1995.01.01 දින සිට සංශෝධනය විය යුතු අතර 1995.01.01 දින සිට 1995.10.31 දින දක්වා හිඟ වැටුප් එම නිලධාරීන්ට ගෙවිය යුතුය. හිඟ වැටුප් 2001 වර්ෂයේදී ගෙවීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය.

04. ඉහත සඳහන් කාල සීමාව තුළ විශ්‍රාම ලැබූ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් අදල පරිදි පරිවර්තනය කළ යුතු අතර සංශෝධිත විශ්‍රාම වැටුප 2000.10.01 දින සිට ගෙවිය යුතුය. එසේ වුවද, විශ්‍රාමික දිනයේ සිට 2000.09.30 දින දක්වා හිඟ විශ්‍රාමික වැටුප් ගෙවනු ලබන්නේ 2001 වර්ෂයේදීය.

05. මෙම චක්‍රලෙඛ'ය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ එකගත්වය ඇතිවය.

මහින්ද බන්දුසේන
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය